**ඇන්ටි ලෙකෝ මීටරින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් - 2018**

**-----------------------------------------------------------**

## 1.1 මතය

**-------**

ඇන්ටි ලෙකෝ මීටරින් කම්පනි(ප්‍රයිවට්) ලිමිටඩ්හි 2018 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයැයි අදහස් කරනු ලබන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍යප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිසි බලධරයාගේ අනුමතිය නොමැතිව සමාගම විසින් ඇතැම් ජර්නල් සටහන් ඇතුලත් කර තිබුණි. | එය සටහන් කර ගත් අතර ඒ සඳහා එකඟ වේ. | ජර්නල් සටහන් ඇතුලත් කිරීමේ ක්‍රියාවලියපිළිබඳව මනා අභ්‍යන්තර පාලනයක් සමාගම විසින් ක්‍රියාත්මක කළ යුතුය. |

### 1.5.2 ශේෂ සනාථන නොමැතිවීම

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |

| | | |
|---|---|---|
| චීනයේ ඇන්ටි මීටර් සමාගමට ගෙවිය යුතු රු. 1,769,508 ක් වූ ශේෂය සඳහා වූ සනාථ කිරීම් සමාගම විසින් ඉදිරිපත් කර නොතිබුණි. | චීනයේ ඇන්ටි මීටර් සමාගමින් එම ශේෂ සනාථන ලබා ගැනීම සඳහා වැඩපිළිවෙළක් යොදන්නෙමු. | චීනයේ ඇන්ටි මීටර් සමාගමට ගෙවිය යුතු සහ සමාගමෙන් ලැබියයුතු ශේෂ සඳහා වූ සනාථ කිරීම් සමාගම විසින් ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

සමලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.39,981,333 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ලාභය රු. 69,231,784 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.109,213,117 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය තුළදී නිපදවන ලද නව විද්‍යුත් මනුසඳහා නව මිල සූත්‍රයක් හඳුන්වා නොදීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියක් සමාගම සතුව නොතිබුණි. | 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඇන්ටි ලෙකෝ මීටරින් කම්පනි(ප්‍රයිවට්) ලිමිටඩ් සංස්ථාපනය කර ඇත. | සමාගම විසින් 2003 අංකපීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුගමනය කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර | 2018 වර්ෂයේදී පළමුවරට නව විද්‍යුත් මනු හඳුන්වා දෙන ලදී. | සමාගම විසින් 2003 |

| | | |
|---|---|---|
| නොතිබුණි. | එබැවින්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් මුල් සමාසික ඇණවුම, පිරික්සුම් ඇණවුමක් වශයෙන් ඇණවුම් කරන ලදී. තවද, මෙම පිරික්සුම් ඇණවුමෙහි ක්‍රියාකාරීත්වය ඇගයීමෙන් අනතුරුව තවදුරටත් විදුලි මනු ඇණවුම් කරන බව සඳහන් කරන ලදී. එබැවින්, 2018 වර්ෂයේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් කරන ලද මනු ඇණවුම අවිනිශ්චිත වූ අතර අවසානයේදී ලංකා විදුලි බල මණ්ඩලය සමග මනු සැපයීම සම්බන්ධයෙන් වූ ගිවිසුම 2019 වර්ෂයේ මැයි මාසයේදී අත්සන් කරන ලදී. එබැවින්, 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ නොහැකි විය. | අංකපීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව, අවශ්‍යතා සැළකිල්ලට ගෙන මුදල් වර්ෂය ආරම්භයට පෙර සියලුම ප්‍රසම්පාදනයන් සැලසුම් කළ යුතුය. |
| (ආ) මිලදී ගන්නා අමුද්‍රව්‍ය සඳහා සමාගම විසින් මිල කැඳවීම් කර නොතිබුණ අතර ඇන්ටි ලෙකෝ මීටරින් කම්පනි(ප්‍රයිවට්) ලිමිටඩ්හි ආශ්‍රිත සමාගම (චීනය) විසින් සියලුම අමුද්‍රව්‍ය මිලදී ගෙන ඇත. | චීනයේ ඇන්ටි මීටර් සමාගම සහ ලෙකෝ සමාගම අතර බද්ධ ව්‍යාපාර ගිවිසුමක් මගින් ඇන්ටි ලෙකෝ මීටරින් සමාගමපිහිටුවා ඇත. චීනයේ ඇන්ටි මීටර් සමාගම, තාක්ෂණික සැපයුම්කරු මෙන්ම මෙම සමාගම සඳහා මනු උපාංග සපයන්නා ද වන අතරවසර 10 ක වගකීම් කාලයක් සහිතව පිරිවිතරවලට අනුකූලව, ගුණාත්මකබවින් යුත් මනු නිෂ්පාදනය සඳහාඅවශ්‍ය වන සකසන ලද ද්‍රව්‍ය හෝ අර්ධ වශයෙන් සකස් කරන ලද උපාංග සපයන අපගේ තාක්ෂණික පාර්ශ්වකරු ද වේ. ඇන්ටි සමාගම වෙතින් සපයන ලද උපාංගවල මිල මූලික සාකච්ඡා මත පදනම් වන අතර එය, එකඟ වූ මිල සූත්‍රය අනුව කාලයත් සමග වෙනස් වේ. එම මිල සූත්‍ර, ගැණුම්කරුවන් වන ල.වි.ම. සහ ලෙකෝ සමාගමටද විනිවිදභාවයෙන් යුක්ත වේ. | සමාගම විසින් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතු වේ. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගෙවන ලද ඉඩම් බදු කුලී මුදල වන රු. 5,457,292 ක් සම්බන්ධයෙන් ඇන්ටි ලෙකෝ මීටරින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. | ඔබගේ අදහස් හා එකඟ වන අතර ඒ සම්බන්ධයෙන් සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත දැනුම් දී ඇත. | සමාගම විසින් අදාළ පාර්ශ්වයන් සමග ගිවිසුමකට එළඹිය යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව, සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සහිතව නුදුරු අනාගතයේදී ඔබගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | සමාගම විසින් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003ජුනි02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව, සමාගම විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සහිතව නුදුරු අනාගතයේදී ඔබගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | සමාගම විසින් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

### 4.3 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003ජුනි02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව, සමාගම විසින් වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සහිතව නුදුරු අනාගතයේදී ඔබගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | සමාගම විසින් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

**4.4 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සහිතව නුදුරු අනාගතයේදී ඔබගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුය. |

**4.5 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් විගණන කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සහිතව නුදුරු අනාගතයේදී ඔබගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | විගණන කමිටුවක් ස්ථාපිත කළ යුතුයි. |

**4.5 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003ජුනි02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, අයවැයගත ආදායම් හා වියදම් ලේඛනයක්, වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක්, වසර අවසානයේදී ශේෂ පත්‍රයක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමග අයවැයගත මූලධන | ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සහිතව නුදුරු අනාගතයේදී ඔබගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | සමාගම විසින් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

වියදම් පිළිබඳ ප්‍රකාශනයක් වාර්ෂික අයවැය ලේඛනයේ අන්තර්ගත විය යුතුයි. කෙසේවුවද, සමාගම විසින් එම අවශ්‍යතා ඉටු කර නොමැත.

## 4.6 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව, සියලුම රාජ්‍ය ආයතන තම විෂය පථය යටතට ගැනෙන අරමුණු සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය යුතුයි. කෙසේවෙතත්, සමාගම, තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත් වී නොතිබුණ අතර සපුරාගත යුතු ඉලක්ක, එම අරමුණු සපුරා ගැනීමේදී ඇතිවන අඩුපාඩු සහ එහි ප්‍රගතිය මැන බැලීම සඳහා වන සුදුසු දර්ශකයන් ද හඳුනා ගෙන නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සහිතව නුදුරු අනාගතයේදී ඔබගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | සමාගම, තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කළ යුතුයි. |